## සංක්‍රාන්ති යුක්තිය:

# තිරසර සාමයක් සඳහා ගමන් මඟ

## සංක්‍රාන්ති යුක්තිය:
## තිරසර සාමයක් සඳහා ගමන් මග

2024 අප්‍රේල්

ISBN 978-624-5860-08-1

සංස්කරණය:
**අජිත් පැරකුම් ජයසිංහ, දුලාන් දසනායක**

දෙමළ පරිවර්තනය:
**මධුශාලිනී ජේයපාන්ඩි**

පිටු සැකසුම හා මුද්‍රණය

**adARTS**

මහරගම

ප්‍රකාශනය

**රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය**

අංක 56/2, පාලිත පෙදෙස, කොළඹ 09, ශ්‍රී ලංකා.

දුරකථන: 0112 66 9100

Email: mail@righttolife.lk

Websites: www.righttolife.lk www.aithiya.lk www.dailyreporter.lk www.slcat.org

Facebook pages: Right to Life Sri Lanka | Aithiya | Daily Reporter | SLCAT

Youtube: Aithiya Media | Right to Life

# පටුන

පූජා ව්‍යාපෘතිය කුමක් සඳහා ද? 5

සංක්‍රාන්ති යුක්තිය (Transitional Justice) යනු කුමක් ද? 5

යුද්ධයේ අවසානයේ සිට මේ දක්වා සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලියේ ඉතිහාසය 7

උදලාගම කොමිසම - 2006 7

බෑන් කී මූන්ගේ ලංකාගමනය - 2009 8

දරුස්මාන් කමිටුව - 2011 8

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව LLRC - 2010 9

මැක්ස්වෙල් පරණගම කොමිසම - 2013 10

යුද ගැටුම් පිළිබඳ ජාත්‍යන්තර විශේෂඥයන්ගේ කමිටුව 11

නවනීදන් පිල්ලේ ලංකාවට පැමිණීම - 2013 11

එක්සත් ජාතීන්ගේ විමර්ශන කමිටු වාර්තාව OISL - 2015 11

30/1 යෝජනාවලිය 12

සංහිඳියාව සඳහා වන ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය 13

34/1 යෝජනාවලිය 14

46/1 යෝජනාවලිය 15

51/1 යෝජනාවලිය 16

නවාස් කමිටු වාර්තාව 17

සංක්‍රාන්ති යුක්තිය සාක්ෂාත් කිරීම උදෙසා දැනට පිහිටුවා ඇති ආයතන 17

1. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) 17
2. හානි පූරණ කාර්යාලය (OR) 18
3. ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කාර්යාලය (ONUR) 19

පිහිටුවීමට යෝජිත යාන්ත්‍රණය 19

1. සත්‍ය, සමගිය සහ සංහිඳියාව සඳහා වන ස්වාධීන කොමිෂන් සභාව (CTUR) 19

**යුක්තිය හා වගවීම සඳහා ජනතා එකමුතුව**
**People Unite for Justice and Accountability (PUJA)**

## පූජා ව්‍යාපෘතිය කුමක් සඳහා ද?

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ජනවාර්ගික බෙදීම් ඉක්මවා යමින් යුක්තිය හා වගවීමේ ක්‍රියාවලිය සඳහා මහජන සහයෝගය ගොඩනැගීම යි.

එහිදී වගවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම විවිධ ආකාරවලින් සිදුවනු ඇත. දේශීය නීති පද්ධතිය, නව සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයන් පිහිටුවීම සහ ජාත්‍යන්තර ක්‍රියාවලීන් කෙරෙහි අවධානය යොමු වනු ඇත. 2022 ආර්ථික අර්බුදයෙන් පසු, ආර්ථික අපරාධ සම්බන්ධයෙන් වගවීම සඳහා වන මහජන උනන්දුව යුද අපරාධ ඇතුළු සියලු අපරාධ සඳහා වගවීම පිළිබඳ සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා ද යොදා ගනු ඇත.

එහි දීර්ඝ කාලීන පරමාර්ථය වන්නේ ස්වාධීන, විශ්වසනීය, පාරදෘශ්‍ය, ඵලදායී සහ වින්දිතයන් කේන්ද්‍ර කරගත් සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලීන් හරහා ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන සංහිඳියාව සහ සාමය ගොඩනැගීමයි.

## සංක්‍රාන්ති යුක්තිය (Transitional Justice) යනු කුමක් ද?

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සංක්‍රාන්ති යුක්තිය මෙසේ අර්ථකථනය කරයි:

> ***සංක්‍රාන්ති යුක්තිය යනු, මහා පරිමාණ අතීත අපයෝජන උරුමයක් සම්බන්ධයෙන් වගවීම සහතික කිරීම, යුක්තිය පසිඳලීම සහ වගවීම සහ සංහිඳියාව ලබාගැනීම සඳහා සමාජයක් දරන වෑයමක් හා සම්බන්ධ ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණයන්හි පූර්ණ පරාසයයි.***

***රටක යුද්ධයක්, ඒකාධිපති පාලනයක් හෝ වෙනයම් දරුණු ගැටුමක් පැවතුන වකවානුවක සිට ප්‍රජාතන්ත්‍රවාදී වූත් නීතියේ ආධිපත්‍යය මත පදනම් වූත් පාලනයක් වෙත ගමන් කරද්දී ඒ අතරතුර කාලය දේශපාලනික වශයෙන් සංක්‍රාන්ති යුක්තික කාලයක් වශයෙන් හඳුන්වනු ලැබේ. ලංකාව වර්තමානයේ දී පසු කරමින් සිටින්නේ එවැනි අවධියකි.***

***සාමාන්‍ය තත්ත්වයක් තුළ ඕනෑම ආකාරයක අපරාධයක් සඳහා නීතිය ක්‍රියාත්මක වීම බලාපොරොත්තු වුනත් රටක් තුළ යුද්ධයක් හෝ ඒකාධිපති පාලනයක් පවතින විට සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එසේත් නොමැති නම් එවැනි කාලයක විශාල වශයෙන් අපරාධ සිදුවන නිසාම පොලිසියට, නීතිපති දෙපාර්තුමේන්තුවට සහ අධිකරණයට ඒ සඳහා වහා ප්‍රතිචාර දැක්වීම අපහසු හෝ කළ නොහැකි දෙයක් විය හැකියි. ඒ නිසාම මෙවන් කාලයක් සම්බන්ධයෙන් යුක්තිය පසිඳලීමට වෙනත් යාන්ත්‍රණ ඇති කළ යුතුයි.***

සත්‍යය විමර්ශනය කිරීම, යුක්තිය පසිඳලීම, හානිපූර්ණය සහ ගැටුම් නැවත ඇති නොවීම පිණිස වන සහතිකවීම් ප්‍රවර්ධනය කිරීම සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලියෙහි ප්‍රධාන කොටස් වේ.

2009 වසරේදී සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු, ජාතීන් අතර සංහිඳියාව නිර්මාණය කිරීම ප්‍රමුඛ කාර්යයක් බවට පත්වී තිබේ. එහි දී සංක්‍රාන්ති යුක්තිය ඉතා වැදගත් වේ.

සංක්‍රාන්ති යුක්තියෙහි ප්‍රධාන ලක්ෂණ කීපයක් පහත දැක්වේ:

1. එවැනි තත්වයක් නැවත ඇති නොවන බවට සහතික වීම (ආයතනික, නෛතික, සමාජයීය, දේශපාලනික, ආර්ථික ආදී ප්‍රතිසංස්කරණ ඇතුළත් පුළුල් ක්‍රියාදාමයක් මෙහිදී අවශ්‍යය).

2. අපරාධමය වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීම හා නීතිමය වගවීම තහවුරු කිරීම.

3. හානිපූරණය (හානිපූර්ණය යනු වන්දි ගෙවීම පමණක් නොවේ. පීඩාවට පත්වූවන්ට ප්‍රතිකාර කිරීම, මනෝ සමාජයීය සහාය සැපයීම, පුනරුත්ථාපනය, අනුස්මරණය වැනි දේ ද එයට අයත් වේ).

4. සත්‍යය සෙවීම (විශේෂයෙන්ම අතුරුදහන් වූවන්ගේ පවුල්වලට මෙය ඉතා වැදගත්ය).

දීර්ඝකාලීන සන්නද්ධ ගැටුමක් හෝ සන්නද්ධ නීතියේ පාලනයෙන් පිට ඒකාධිපති පාලනයක් අවසානයේදී එකී කාල සීමාව තුළ සිදු වූ නීතියේ පාලනයෙන් පිට සිදුවූ ක්‍රියා පිළිබඳ සත්‍යය සොයා ගනිමින් යුක්තිය සඳහා ජනතාවට තිබෙන ප්‍රවේශය සහතික කර දණ්ඩ මුක්තිය මුළුමනින්ම පිටු දැක වින්දිතයන්ට හානි පූරණය සිදු කර නැවත එවැනි සිදු වීම් ඇති වීම සහතික කරමින් අනාගතය සඳහා තිරසර සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය සහතික කිරීම සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලියේ අරමුණයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයේ 42 වන සැසිවාරයේදී සම්මත කරන ලද මානව හිමිකම් සහ සංක්‍රාන්ති යුක්තිය යන නමින් යුත් 42/17 දරණ යෝජනාව මගින් තිරසර සංවර්ධනය සහ මානව හිමිකම් තිරසර ලෙස සහතික කිරීම සඳහා සංක්‍රාන්ති යුක්තියේ වැදගත්කම අවධාරණය කරන ලදී.

එකී යෝජනාවලිය තුළින් අතීත හිංසාවන්, වින්දිතයින්ගේ අවශ්‍යතා සහ ඵලදායී පිළියමක් සඳහා වින්දිතයන්ට ඇති අයිතිය සහ ඒවා නැවත ඇතිවීම වැළැක්වීම සඳහා සංක්‍රාන්ති යුක්තිය උපාය මාර්ග සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහ අධිකරණ සහ අධිකරණ නොවන යාන්ත්‍රණයන් ස්ථාපිත කරන ලෙස සියලු රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටින ලදී.

## යුද්ධයේ අවසානයේ සිට මේ දක්වා සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලියේ ඉතිහාසය

### උදලාගම කොමිසම - 2006

2006 වසරේ යුද්ධය පවතින කාලසීමාවේ දී විනිසුරු නිශ්ශංක උදලාගම ප්‍රමුඛ සාමාජිකයන් 10 දෙනෙකුගෙන් යුතුව ස්ථාපිත වූ උදලාගම කොමිෂන් සභාවේ කාර්යය වූයේ යුද සමයේ මානව හිමිකම් කඩවීම හා එම කාලයේදී සිදු වූ ඝාතන සිදුවීම් 16ක් පිළිබඳව විමර්ශනය කිරීමයි.

හිටපු විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය, දිගම්පතානේ දී නිරායුධ නාවික භටයන් 98 දෙනා ඝාතනය, ප්‍රංශ රාජ්‍ය නොවන

සංවිධානයක පුද්ගලයන් 17 දෙනෙකු ඝාතනයට ලක්වීම, පොතුවිල් මුස්ලිම් වැසියන් 10 දෙනෙකු ඝාතනය වීම, කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ පුද්ගලයන් 68 දෙනාගේ ඝාතනය, හා යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ්ගේ ඝාතනය කොමිසම මඟින් විමර්ශනය කළ ඝාතන සිදුවීම් 16න් කිහිපයකි.

2006 වසරේ පත්කළ කොමිෂන් සභාවේ වාර්තාව, 2015 වසරේ මහින්ද රාජපක්ෂ පාලනය පරාජයට පත් වී ගොඩනැඟුණු දින සියයේ ආණ්ඩු වැඩපිළිවෙළ අතරතුර අගමැති රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුවට සභාගත කරන තෙක්ම එම වාර්තාව නිකුත් නොකෙරුණි. උදලාගම කොමිසමේ නිර්දේශවල සාරාංශය වූයේ, යුද්ධය පැවැති සමයේ සිදු වූ මානව හිමිකම් කඩවීම් සම්බන්ධව සොයා බැලීමට ස්වාධීන කමිටුවක් පත් කළ යුතු බව සහ අතුරුදන්වූවන්ගේ පවුල්වල ජීවන තත්ත්වය නගාසිටුවීමට හා උපදේශන සේවා ලබාදීමට ක්‍රියා කළ යුතු බවයි.

## බෑන් කී මූන්ගේ ලංකාගමනය - 2009

2009 මැයි මාසයේ යුද ගැටුම් අවසන් වීමත් සමගම මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආරාධනයෙන් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ එවකට එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වූ බෑන් කී මූන්, ශ්‍රී ලංකා ආණ්ඩුව සමග ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කළේය.

එම ඒකාබද්ධ ප්‍රකාශය මගින් ලංකා ආණ්ඩුව,

1. යුද්ධයෙන් අවතැන්වූවන් කඩිනමින් පදිංචි කරන බවටත්,
2. මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ දේශීය පරීක්ෂණයක් පවත්වන බවත්,
3. යුද්ධයට තුඩු දුන් හේතු ඉවත් වන පරිදි දේශපාලන විසඳුමක් හඳුන්වා දෙන බවටත්,

ප්‍රකාශ කළේය.

## දරුස්මාන් කමිටුව - 2011

ඉන්දුනීසියානු ජාතික මර්සුකි දරුස්මාන්ගේ සභාපතිත්වයෙන් සහ දකුණු අප්‍රිකාවේ සත්‍යය හා ඒකාග්‍රතාවය පිළිබඳ කොමිසමේ කොමසාරිස්වරියක වූ යස්මින් සූකා සහ ඇමෙරිකානු ජාතික ස්ටීවන්

රට්නර්ගේ සාමාජිකත්වයෙන් එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සඳහා මෙම කමිටුව පත් කරන ලදී. පුද්ගලයන් 2,300කගෙන් සාක්ෂි 4,000ක් ලබාගෙන මෙම විමර්ශනය සිදු කළ බව සඳහන් වේ. ඒ අනුව නිකුත් කළ වාර්තාවේ, මානුෂවාදී නීති උල්ලංඝනයට අදාළව ශ්‍රී ලංකා ආණ්ඩුවට පොකුරු ෂෙල් වෙඩිලිවලින් සිවිල් වැසියන් ඝාතනය කිරීම, ආණ්ඩු විරෝධී ජනමාධ්‍යවේදීන් ඝාතනය, රෝහල් හා තහනම් ස්ථානවලට ෂෙල් වෙඩි එල්ල කිරීම ඇතුළු කරුණු පහක් මත ශ්‍රී ලංකා රජයට චෝදනා එල්ල විය. සිවිල් ජනතාව පළිහක් ලෙස භාවිතා කිරීම, එල්ටීටීඊ පාලන ප්‍රදේශවලින් පලා එන සිවිල් වැසියන් ඝාතනය කිරීම, මරාගෙන මැරෙන ප්‍රහාර මඟින් සිවිල් වැසියන් ඝාතනය, හා ළමා සොල්දාදුවන් බඳවා ගැනීම ඇතුළු ප්‍රබල චෝදනා හයක් මත එල්ටීටීඊ සංවිධානයටද චෝදනා එල්ලකරයි. මෙම කමිටු වාර්තාවේ නිර්දේශ අතර උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තා නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා තිබීමද සුවිශේෂී වේ.

## උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව LLRC - 2010

දශක තුනක් පැවති යුද්ධ ගැටුම් අවසන් කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කිරීමට නීතිඥ සී. ආර්. ද සිල්වාගේ ප්‍රධානත්වයෙන් 2010 නොවැම්බර් 03 වැනි දින එවකට ජනාධිපතිව සිටි මහින්ද රාජපක්ෂගේ නියමයෙන් පත් කරන ලද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාව 2011 වසරේ නිකුත් කෙරුණි. එය පශ්චාත් යුද කාලීන ශ්‍රී ලංකාවේ ජාතීන් අතර සංහිඳියාව උදෙසා නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කිරීමට සමත් වූ වාර්තාවකි.

එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බෑන් කී මූන් විසින් පත් කරන ලද දරුස්මාන් කමිටුව සමඟ ඇති විය හැකි බැරෑරුම් තත්ත්වය අවබෝධකරගත් ආණ්ඩුව එයට විකල්පයක් ලෙස දේශීය වශයෙන් පරීක්ෂණයක් කොට අවශ්‍ය නිර්දේශ ලබාදීම අරමුණු කරගනිමින් මෙම කමිටුව පත් කරන ලදී.

අවතැන් වූ ජනතාව සඳහා නිවාස ලබා දීම, ශ්‍රී ලංකාවට පැමිණීමට කැමති යුද සමයේ ඉන්දියාවට පළාගිය පුද්ගලයන්ට නැවත පැමිණීමට ඉඩ විවර කිරීම, යුද්ධයෙන් බැට කෑ උතුරු නැගෙනහිර සියලු ජනතාවගේ සුබසාධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා විනාශ වී ඇති පොදු දේපළ හැකි ඉක්මනින් නැවත පිහිටුවීම වැනි කරුණු එම

කොමිසම විසින් ඉදිරිපත් කළ යෝජනා අතරින් කිහිපයකි. 2012 මාර්තු මාසයේදී එක්සත් ජාතීන් විසින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ මෙම යෝජනා සියල්ල ක්‍රියාත්මක කරන ලෙස ශ්‍රී ලංකා රජයට දැනුම් දෙනු ලැබිණි.

එකී වාර්තාවේ ප්‍රධාන කරුණු වන්නේ ගැටුමේ අවසන් අදියරට අදාළ ජාත්‍යන්තර මානුෂීය ගැටලූ පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ, මානව හිමිකම් පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ, නැවත පැමිණීම් හා යළි පදිංචි කිරීම් ඇතුළු ඉඩම් ගැටලු පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ, හිමිකම් ප්‍රතිෂ්ඨාපනය/ වන්දි සහන පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ පශ්චාත් ගැටුම් ප්‍රතිසන්ධානය කෙරෙහි බලපාන ගැටලු පිළිබඳ නිරීක්ෂණ, ප්‍රතිසන්ධානය පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ වේ. මේවා ඇතුළත්ව ඉතා පුළුල් වාර්තාවක් එවකට ජනාධිපතිවරයා වෙත ලබා දෙනු ලැබීය.

**මැක්ස්වෙල් පරණගම කොමිසම - 2013**

අතුරුදන්වූවන් හා යුද්ධය අවසාන සමයේ රජය හා එල්ටීටීඊය සංවිධානය සිදු කළායැයි පැවසෙන යුද අපරාධ පිළිබඳව සොයා බැලීමට 2013 වසරේ මහාධිකරණ විනිසුරු මැක්ස්වෙල් පරණගම ප්‍රමුඛව සුරංජනා විද්‍යාරත්න, මනෝ රාමනාදන් ඇතුළු සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් කොමිසමක් පත් කළ අතර, අතුරුදන්වූවන්ගේ පැමිණිලි 1000ක පමණ විමර්ශනයෙන් ඉදිරිපත් කළ වාර්තාවේ නිර්දේශයන් 11ක් අඩංගු විය.

අතුරුදන්වූවන් පිළිබඳව සොයා බැලීමට නීතිමය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම හා එම පවුල්වලට මූල්‍යමය වන්දි ලබා දීම, අත්අඩංගුවේ පසුවන එල්ටීටීඊ සැකකරුවන්ගේ නඩු කඩිනම් කිරීම, මායිම් ගම්මානවල එල්ටීටීඊයෙන් පීඩා විඳි සිංහල ජනයාගේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කර දීම, තවමත් සරණාගත කඳවුරුවල සිටින ජනතාවට ස්ථිර නිවාස සාදා දීම ඒවායින් කිහිපයකි.

යුද අපරාධ සිදු වී ඇති බව මෙම වාර්තාවේ සඳහන් නොවීම විශේෂ වන අතර එල්ටීටීඊය සංවිධානය විසින් බලෙන් සිවිල් පුරවැසියන් රඳවාගත් බවත්, පැන යන්නට උත්සාහ කරන්නන් වෙඩි තබා මරා දැමූ බවත් සඳහන් කරයි. දරුස්මාන් කොමිසමට අනුව යුද්ධයේ අවසන් සමයේ සිවිල් වැසියන් 40,000ක් මියගොස් ඇතත්, එය ප්‍රතික්ෂේප කරන පරණගම කොමිසම එම ගණන 7000 - 7500 අතර බව සඳහන් කරයි.

## යුද ගැටුම් පිළිබඳ ජාත්‍යන්තර විශේෂඥයන්ගේ කමිටුව

LLRC වාර්තාවෙහි නිර්දේශයකට අනුව අතුරුදන්කිරීම් සම්බන්ධයෙන් සොයා බැලීමට නිශ්චිත ආයතනයක් ඇති කළ යුතු බව පෙන්වා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට පරණගම කොමිෂම පත් කළ අතර එහි කටයුතු සඳහා උපදෙස් ලබා දීමට යුද නීතිය පිළිබඳ ජාත්‍යන්තර විශේෂඥයන් පස් දෙනෙකු වන රාජ නීතිඥ ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා, මහාචාර්ය ඩේවිඩ් ක්‍රේන්, රාජ නීතිඥ ශ්‍රීමත් ජෙෆ්රි නයිස්, රාජ නීතිඥ රොඩ්නි ඩික්සන් හා මහාචාර්යය මයිකල් නිව්ටන් යන නීති විශාරදයන් පස් දෙනා පත් කරන ලදී. මෙම කමිටුව ඉදිරිපත් කළ වාර්තාව මඟින් යුද නීතියේ විධිවිධාන උල්ලංඝනය නොවුණු බව පෙන්වා දී තිබේ.

## නවනීදන් පිල්ලේ ලංකාවට පැමිණීම - 2013

එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්ව සිටි නවනීදන් පිල්ලේ 2013 අගෝස්තු මස ලංකාවේ සංචාරයක නිරත වූවාය. එහිදී කොමසාරිස්වරිය උතුරු ප්‍රදේශයේ සංචාරය කළ අතර උතුරේ මිනිසුන් සමග සෘජුවම සාකච්ඡා කිරීමටත් විවිධ දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන සහ යුද්ධයෙන් පීඩිත ජනතාව හමුවී සාකච්ඡා කිරීමටත් ඇයට අවස්ථාව හිමි විය. ඇය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකාව පිළිබඳ යාවත්කාලීන වාර්තාවක් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 24 වැනි සැසිවාරයේදී ඉදිරිපත් කරන ලදී. යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශ නැවත ගොඩ නැංවීමේදී හා ජනයා නැවත පදිංචි කිරීමේදී රජය ලබා ඇති ප්‍රගතිය ඇය විසින් ඉහළ ඇගයීමකට ලක්කර තිබූ අතර රඳවාගෙන සිටින එල්ටීටීඊ සාමාජිකයන්ට සාක්ෂි ඇත්නම් නීති මගින් කටයුතු කිරීම, නිදහස් කිරීම හෝ පුනරුත්ථාපනය කිරීම කඩිනම් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී.

## එක්සත් ජාතීන්ගේ විමර්ශන කමිටු වාර්තාව OISL - 2015

ශ්‍රී ලංකාවේ යුද අපරාධ හා මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විමර්ශන කමිටු වාර්තාව 2015 වසරේ දී නිකුත් කෙරිණි. සාක්ෂිකරුවන් 3,000කගෙන් සාක්ෂි විමසූ බව එම වාර්තාවේ සඳහන් විය. වාර්තාව රජයේ හමුදා සහ විමුක්ති කොටි සංවිධානය යන දෙපාර්ශ්වයටම අදාළ වන පරිදි මානව හිමිකම් උල්ලංඝනයන් විමර්ශනය කර ඇති බව පෙනී යයි. වාර්තාවේ ප්‍රධාන නිගමනය වන්නේ ද එකී

දෙපාර්ශ්වයම යුද අපරාධ ලෙස සැලකිය යුතු අපරාධයන්ට වග කිව යුතු බවට පිළිගත හැකි සාක්ෂි තිබෙන බවයි. එහි ප්‍රධාන නිර්දේශයන්ගෙන් කියැවෙන්නේ අදාළ සිදුවීම් අධිකරණමය පරීක්ෂණයකට ලක් කර වරදකරුවන්ට දඬුවම් ලබාදෙන ලෙසයි. එය ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියට පමණක් කළ නොහැකි හෙයින් මිශ්‍ර අධිකරණ පද්ධතියක් ස්ථාපිත කරන මෙන් නිර්දේශ කර තිබුණි. මිනීමැරීම්, ලිංගික හිංසන, අතුරුදහන් කිරීම්, සාමාන්‍ය ජනතාවට හා පොදු ස්ථානවලට පහර දීම්, මානුෂීය ආධාර වැළැක්වීම, කුරිරු වධහිංසා, ළමා හමුදා හා පැහැර ගැනීම් යන කරුණු වාර්තාව මගින් මතු කර තිබිණි.

### 30/1 යෝජනාවලිය

ශ්‍රී ලංකා ආණ්ඩුවේ ද සම අනුග්‍රාහකත්වයෙන් ශ්‍රී ලංකාවේ මානව හිමිකම්, සංහිඳියාව සහ වගවීම සම්බන්ධ 30/1 දරන යෝජනාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් 2015දී සම්මත කරන ලදී. ශ්‍රී ලංකාවේ යුද්ධයේ අවසාන භාගයේ සිදු වූ බව පැවසෙන බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගවීම ක්‍රියාත්මක කිරීම, සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම, අතුරුදහන් වූවන් පිළිබඳ සොයා බැලීම ඇතුළු කරුණු ගණනාවක් ඇතුළත් එක්සත් ජාතීන්ගේ මෙම යෝජනා සම්මතය ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකාව පොරොන්දු වූව ද එය එලෙසින්ම ඉටු කිරීමට අසමත් වීම නිසා ලංකාණ්ඩුව 2017 වසරේ දී තවත් අවුරුදු දෙකකට කල් ගත්තේය. මෙම යෝජනාව අනුව රජය ලබා දුන් පොරොන්දු 36 ක් පවතින බව වෙරිටේ රිසර්ච් පෙන්වා දෙන අතර එම පොරොන්දු තේමාවන්ට වර්ග කළ හැකි බවද පෙන්වා දෙයි.

එනම්,

1. සංක්‍රාන්ති යුක්තිය සහ සංහිඳියාව
2. අයිතිවාසිකම් සහ නීතියේ ආධිපත්‍ය
3. ආරක්ෂාව සහ නිර්හමුදාකරණය
4. බලය බෙදා ගැනීම
5. අන්තර්ජාතික මැදිහත්වීම්.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සම්මේලනයේ 30/1 යෝජනාවලිය අනුව රජය එකඟ වී ඇති ප්‍රධාන කරුණු 9ක් ඇති බව බීබීසී සිංහල

සේවය පෙන්වා දෙයි. ඒවා නම්,

1. කාලානුරූපී අධිකරණ ක්‍රියාවලියක් සඳහා පුළුල් ජාතික උපදේශකත්වයක් ලබා දීම
2. සත්‍යය, නීතිය, සංහිඳියාව සහ යළි ඇති ගැටුම් නොවීම සම්බන්ධයෙන් කොමිසමක් ස්ථාපනය කිරීම
3. අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලයක් ස්ථාපනය කිරීම
4. වන්දි ගෙවීම් කාර්යාලයක් ස්ථාපනය කිරීම
5. එල්ටීටීඊ සංවිධානය විසින් සිදු කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියා සහ අපචාර විමර්ශනය කිරීම
6. විශේෂ උපදෙස් මත ක්‍රියාත්මක අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම
7. අධිකරණ සහ නීතිමය ආයතන මෙහෙයවීම සඳහා අවංක සහ අපක්ෂපාතී පුද්ගලයින් පත් කිරීම
8. ජාත්‍යන්තර විනිසුරුවරුන්, නීතිවේදීන්, නීතිඥයන් සහ විමර්ශකයන් ඒකාබද්ධ කිරීම සඳහා විශේෂ නීති සම්පාදනය කිරීමට දෙමුහුන් විශේෂ අධිකරණයක් ස්ථාපනය කිරීම
9. කාලානුරූපී අධිකරණ ක්‍රියාවලිය සඳහා ජාත්‍යන්තර පාර්ශවකරුවන්ගෙන් මූල්‍යමය, ද්‍රව්‍යමය හා තාක්ෂණික සහය ලබා ගැනීමට අවසර දීම

**සංහිඳියාව සඳහා වන ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය**

මෙම 2015 ඔක්තෝබරයේ දී ශ්‍රී ලංකාව ජිනීවා මානව හිමිකම් කවුන්සලයේ 30/1 යෝජනාවට සම අනුග්‍රාහකත්වය දැක් වූ පසු එකී යෝජනාවේ සදහන් කරුණු ද සැලකිල්ලට ගනිමින්, සංහිඳියාව ඇති කිරීම සඳහා මහජන අදහස් ද ඇතුළත් කර ගැනීමේ අරමුණින් සිවිල් සංවිධාන නියෝජිතයන් 11 දෙනෙකුගේ ප්‍රධානත්වයෙන් සංහිඳියාව සඳහා වන ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය පිහිටුවන ලදී. සංහිඳියාව සඳහා වන ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ සභාපති ධුරය මනෝරානි සරවනමුත්තු මහත්මිය විසින් දරන ලද අතර එහි ලේකම් වූයේ

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුය. සෙසු සාමාජිකයන් වූයේ, ශාන්තා අභිමානසිංහම්, විසාකා ධර්මදාස, ආචාර්ය ෆර්සානා හනීෆා, කේ.ඩබ්ලිව්. ජනරංජන, මහාචාර්ය චිත්‍රලේඛා මෞනගුරු, මිරාක් රහීම්, මහාචාර්ය ගමීලා සමරසිංහ, මහාචාර්ය දයා සෝමසුන්දරම්, ගාමිනී වියන්ගොඩ යන මහත්ම මහත්මීන්ය.

එකී කාර්යසාධක බලකායේ අවසන් වාර්තාවෙන් ජිනීවා යෝජනාව ද මහජන අදහස් ද සැලකිල්ලට ගනිමින් සංහිඳියාව උදෙසා ගත යුතු පියවර සම්බන්ධ නිර්දේශ ගණනාවක් රජයට ඉදිරිපත් කරන ලදී. එකී යෝජනා අතර විශේෂ යාන්ත්‍රණයන් පිළිබඳ යෝජනා ද තිබුණු අතර එවන් විශේෂ යාන්ත්‍රණයන් හතරක් පිහිටුවීමට රජයට යෝජනා කරන ලදී. එකී යාන්ත්‍රණ හතර පහත දැක්වේ.

1. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම සහ අතුරුදහන් වූවන් පිළිබඳ සහතික නිකුත් කිරීම - දැනටමත් මෙය ක්‍රියාත්මක වෙයි.

2. වන්දි කාර්යාලය - මෙය දැනටමත් හානි පූරණ කාර්යාලය ලෙස ස්ථාපිත කර තිබේ.

3. සත්‍යය යුක්තිය සංහිඳියාව හා නැවත සිදු නොවීම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම.

4. විශේෂ උපදේශක කාර්යාලය සහ අධිකරණ යාන්ත්‍රණය.

**34/1 යෝජනාවලිය**

2017 වසරේ ඉදිරිපත් කෙරුණු 34/1 යෝජනාවලිය මඟින් යම් නිශ්චිත විෂය ක්ෂේත්‍රයන් යටතේ රට තුළ කළ යුතු වූ නීතිමය ප්‍රතිසංස්කරණයන් කිරීමටත් දෙමුහුන් අධිකරණය, හානිපූරණය, අතුරුදන්වූවන් සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා වන යාන්ත්‍රණයන් පිහිටුවීම, ලසන්ත වික්‍රමතුංග ඝාතනය, ප්‍රගීත් එක්නැළිගොඩ ඝාතනය ඇතුළු තෝරා ගත් විශේෂිත නඩු සම්බන්ධයෙන් විමර්ශනයන් කර අවසන් කිරීමටත් නිර්දේශ කරන ලදී. ඒ අනුව මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අදාළව වාර්තාවක් සැපයීමට 2019 මාර්තුවේදී ලංකාවට නියමව තිබුණි.

යහපාලන රජය එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග ඇතිකරගෙන තිබෙන ගිවිසුම් තමන් බලයට පත් වුවහොත් ප්‍රතික්ෂේප කරන බව ශ්‍රී

ලංකා පොදුජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ 2019 ඔක්තෝබර් 15දා පැවැත්වුණ පුවත්පත් සාකච්ඡාවේදී පැවසීය. එම අවස්ථාවේදී ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රකාශයට උගත පූරණයක් කරමින් මහාචාර්ය ජී.එල්. පීරිස් පැවසුවේ එම ගිවිසුම් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණි බවයි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාවේදී සම අනුග්‍රාහකත්වය දක්වන ලද 30/1 සහ 40/1 යෝජනා සම්මතයන් දෙකෙන් ඉවත් වීමට 2019 නොවැම්බර් මස බලයට පත්වූ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව තීරණය කළේය. ඒ බව විදේශ ඇමතිවරයා විසින් මානව හිමිකම් කවුන්සිලයේ 43වන සැසිවාරයේදී නිල වශයෙන් දැනුම් දෙන ලදී. (40/1 යෝජනා සම්මතය මගින් 30/1 යෝජනාවේ කරුණු සාක්ෂාත් කිරීමට ශ්‍රී ලංකා රජය සිදු කරන උත්සහයන් අගය කරන ලද අතර ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය, සාමය, මානව හිමිකම්, සත්‍යය, සංහිඳියාව සහ වගවීම සහතික කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා උපදේශාත්මක සහය ශක්තිමත්ව ලබා දෙන ලෙස මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් හා මානව හිමිකම් පිළබද විශේෂ නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටියි. ශ්‍රී ලංකාවේ ප්‍රගතිය නිරන්තරයෙන් මැන බලන ලෙසත්, 43වන සැසියට ශ්‍රී ලංකාව සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් 46 වන සැසියේදී 30/1 යෝජනාව ක්‍රියාත්මක වීම සම්බන්ධ සාකච්ඡාවක් පවත්වන ලෙසත් මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ඉල්ලා තිබුණි.)

### 46/1 යෝජනාවලිය

2021 මාර්තු මස පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 46වෙන සැසි වාරයේදී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් හා සංහිඳියාව සම්බන්ධ යෝජනාවක් බහුතර ඡන්දයෙන් සම්මත කරන ලදී. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 46/1 යෝජනා සම්මතය නම් ප්‍රකට එහි අරමුණ ලෙස දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම හා මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමයි.

යුදගැටුම පැවති සමයේ දැඩි මානව හිමිකම් උල්ලංඝනයන් හා ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල අන්දමින් කඩකිරීම සම්බන්ධයෙන් ඉතා විධිමත් හා අපක්ෂපාතී විමර්ශනයක් කඩිනමින් පැවැත්වීම, සාක්ෂි සංරක්ෂණය හා විශ්ලේෂණය කිරීම, සාක්ෂිකරුවන් හා වින්දිතයන්

ආරක්ෂා කිරීම සහ වගඋත්තරකරුවන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම තහවුරු කිරීමට ශ්‍රී ලංකාව කටයුතු කළ යුතු බව එම යෝජනා සම්මතයේ දැක්වේ. එසේම, බලය විමධ්‍යගත කිරීම සම්බන්ධ රාජ්‍ය වගකීම් ඉටුකරන ලෙස ද ශ්‍රී ලංකාවට එමගින් යෝජනා කෙරේ.

මෙම කාර්යයන් වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් කාර්යාලයේ විශේෂ ඒකකයක් පිහිටුවන බව ද එහි දැක්වේ.

**51/1 යෝජනාවලිය**

'ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම' යනුවෙන් යෝජනා සම්මතයක් 2022 ඔක්තෝබර් 6දා ජිනිවාහි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 51වන සැසි වාරයේදී සිදුවිය.

ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, කැනඩාව, උතුරු අයර්ලන්තය, උතුරු මැසඩෝනියාව, ජර්මනිය, මලාවි සහ ලක්සර්ම්බර්ග් යන රටවලින් සමන්විත ශ්‍රී ලංකාව පිළිබඳ මූලික කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාවට පක්ෂව ඡන්ද 20ක් ලැබුණු අතර විරුද්ධ ලැබුණේ ඡන්ද 07 ක් පමණි. ඡන්දය දීමෙන් වැළකී සිටි රටවල් සංඛ්‍යාව 20කි.

එම යෝජනා සම්මතයෙහි කරුණු 19ක් ඇතුළත් ය. ශ්‍රී ලංකාව මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර අගය කර තිබෙන අතර ආර්ථික අර්බුදය හා මෑත කාලීනව සිදුවූ මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් විමර්ශනය හා නිසි ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමුකර තිබේ.

යෝජනා කෙටුම්පතේ 8 වැනි කාරණය යටතේ ශ්‍රී ලංකාවේ සිදුවූ බව කියන ජාත්‍යන්තර මානව හිමිකම් උල්ලංඝනය වීම් විමර්ශනයට හා ඒ සම්බන්ධයෙන් ගනු ලබන අධිකරණමය හෝ ආශ්‍රිත ක්‍රියාවලිවලට සාමාජික රටවල් සහය දිය යුතුය.

HRC/51/L.1/Rev.1 ලෙස නම් කර තිබෙන මෙම යෝජනාවලිය ශ්‍රී ලංකා රජය තරයේ ප්‍රතික්ෂේප කර තිබේ.

## නවාස් කමිටු වාර්තාව

පූර්වගාමී කොමිෂන් සභා සහ කමිටුවල සොයා ගැනීම් විමර්ශනය කිරීම සඳහා හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් කොමිෂන් සභාවක් පත්කරන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඒ.එච්.එම්.ඩී. නවාස් මහතා සභාපතිත්වය දරන මෙම කමිටුවේ අවසන් වාර්තාවේ කෙටුම්පත් කරන ලද නිර්දේශයන්හි සාරාංශයක් 2023 පෙබරවාරි 6දා ජනාධිපති රනිල් වික්‍රමසිංහ වෙත භාර දෙන ලදී.

පශ්චාත් අර්බුද ගැටලු විසඳීම සඳහා ජනතාව සහ වින්දිතයන් කේන්ද්‍ර කරගත් උපාය මාර්ගයක අවශ්‍යතාවය සහ ඉදිරි ගමන පිළිබඳව නිර්දේශ 27ක් පමණ මෙම සාරාංශයට ඇතුළත් වේ. අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලය, වන්දි ගෙවීමේ කාර්යාලය සහ ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන පිළිබඳ කාර්යාලයේ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් මෙම නිර්දේශවල සාරාංශය අවසන් වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට නියමිතය. ආයතනික ප්‍රතිසංස්කරණ, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීම් ශූන්‍ය කිරීමේ ප්‍රතිපත්තියක් ප්‍රකාශ කිරීම මගින් පුනරාවර්තනය නොවන බවට සහතිකය ලබා ගත යුතු බව කොමිසමේ නිර්දේශයන්හි සඳහන් කර ඇත.

## සංක්‍රාන්ති යුක්තිය සාක්ෂාත් කිරීම උදෙසා දැනට පිහිටුවා ඇති ආයතන

### 1. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP)

2016 ජූනි 22 වන දින මෙම කාර්යාලය පිහිටුවීමට අදාළ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත 2016 අගෝස්තු 11 වන දින පාර්ලිමේන්තුව තුළ සම්මත විය. 2018 පෙබරවාරි 28 වන දින එවක ජනාධිපතිවරයා විසින් මෙම කාර්යාලයට අදාළ කොමසාරිස්වරුන් පත් කරන ලදී.

මෙම කාර්යාලයේ කාර්යභාරය පහත දැක්වෙන පරිදිය.

- අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන් සෙවීම
- බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම
- අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන් පිළිබඳ දත්ත සමුදායක් ගොඩනැගීම
- අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෙනත් සියලු ක්‍රියාවන් සිදු කිරීම

## 2. හානි පූරණ කාර්යාලය (OR)

හානිපූරණය සඳහා වන කාර්යාලය යනු ශ්‍රී ලංකාවේ හානිපූරණ රෙජීමය කළමනාකරණය කිරීම හා අර්බුද හේතුවෙන් පීඩාවට පත් වූවන් හට හානිපුරණයන් ප්‍රදානය කරනු වස් 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත මඟින් ස්ථාපිත කරනු ලැබූ ස්වාධීන ආයතනයකි.

පනතේ පූර්විකාවේ දක්වා ඇති පරිදි මෙම පනත පැනවීම සඳහා වන මූලකාරණය නම් -

'ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ආවේණික ගරුත්වය හා සමාන සහ අහිමි කළ නොහැකි මානව හිමිකම් සහ මේ අයිතීන්ට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වන රාජ්‍ය වගකීම පිළිගන්නා හෙයින් ද:

සියලු ශ්‍රී ලාංකික්යන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ස්ථාවර වූ සඵලදායී ප්‍රතිකර්මයක් වශයෙන් පරිපූරණ හානිපූරණ යෝජනා ක්‍රමයක් අනාගත පරපුර ඇතුළත් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සුබසිද්ධිය හා ආරක්ෂාව උදෙසා ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වන හෙයින් ද:'

ප්‍රචණ්ඩකාරී සිදුවීම් උදෙසා පිළියම් යෙදීමක් ලෙස හානිපූරණයන් ප්‍රදානය කිරීම විශ්වීය වශයෙන් පිළිගත් පියවරක් වන නමුත් ඇතැම් උල්ලංඝනයවීම් ප්‍රකෘතිමත් කළ නොහැකි ඒවා වන අතර හානිපූරණයන් ලෙස ලබා දෙනු ලබන කිසිදු සහනයකින් එකී පීඩා විදි තැනැත්තන් ඔවුන් පෙර සිටි තත්ත්වයට ගෙන ආ නොහැකි බව ද පිළිගත යුතු කරුණකි.

ශ්‍රී ලංකාව තුළ ගැටුම් හේතුවෙන් පීඩා විඳි තැනැත්තන් හට හානිපූරණයන් ප්‍රදානය කිරීමේ ප්‍රවේශය වන්නේ හානිපූරණයන් ලෙස මූල්‍යමය සහන ප්‍රදානය පමණක් නොව, ගැටුම් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන් හට තවදුරටත් සහන ලබා දිය හැකි ආකාරයේ අනෙකුත් මැදිහත්වීම් ද ප්‍රදානය කිරීමට අධිකාරී බලයක් ඇති හානිපූරණය සඳහා වන කාර්යාලය නම් ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනය ස්ථාපිත කිරීමයි. (හානිපූරණ කාර්යාලයේ වෙබ් අඩවිය)

### 3. ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කාර්යාලය (ONUR)

විවිධත්වය සමරන අතරම ශ්‍රී ලංකාවේ මිනිසුන් අතර සහජීවනය සහ එකමුතුකම ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව අධිකරණ අමාත්‍යාංශය යටතේ ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කාර්යාලය (ONUR) පාර්ලිමේන්තු පනතක් ඔස්සේ පිහිටුවීම ද ආණ්ඩුව විසින් සිදු කර ඇත. මෙවැනි කාර්යාලයක් පිහිටුවිය යුතුය යන්න උගත් පාඩම් හා ප්‍රතිසංධානය පිළිබඳ කොමිෂන් සභාවේ (LLRC) නිර්දේශ තුළද එක් ප්‍රබල නිර්දේශයක් විය.

## පිහිටුවීමට යෝජිත යාන්ත්‍රණය

### 1. සත්‍ය, සමගිය සහ සංහිඳියාව සඳහා වන ස්වාධීන කොමිෂන් සභාව (CTUR)

මෙම කොමිෂන් සභාව සඳහා වන පනත් කෙටුම්පත මේ වන විටත් රජය විසින් ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර තවමත් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කොට නැත. මෙම පනත සම්මත වී කොමිෂන් සභාව ක්‍රියාත්මක වන තෙක් කටයුතු කිරීම සඳහා රජය විසින් සත්‍ය සහ ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය සඳහා වූ අන්තර්වාර ලේකම් කාර්යාලය (ISTRM) පිහිටුවා ඇත. මෙම යෝජිත කොමිෂන් සභාව සඳහා අවශ්‍ය නෛතික සහ ප්‍රතිපත්ති රාමුව, මෙහෙයුම් ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ සම්පාදනය කිරීම මෙම අන්තර්වාර ලේකම් කාර්යාලයේ අරමුණයි.

මේ අතර  ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම හෝ සංශෝධනය කිරීම සහ මහජන ආරක්ෂක ආඥා පනත සංශෝධනය කිරීම, වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය

කිරීම, අතුරුදහන් වීම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය අනුමත කිරීම, ශ්‍රී ලංකාවේ අතුරුදහන් වීම් අපරාධ වැරදි බවට පත් කිරීම, අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා 'නුදුටු සහතික' නිකුත් කිරීම, සිවිල් කටයුතුවලදී හමුදා විසින් සිදුකරන භූමිකාව අවසන් කිරීම, ඉඩම් ගැටලු විසඳීම, ජීවනෝපායන් නැවත ආරම්භ කිරීම, ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තා නිකුත් කිරීම, ව්‍යවස්ථාමය වෙනසක් තුළින් දේශපාලන විසඳුම් ලබාදීම වැනි තවත් පොරොන්දු රැසක් තිබේ. ඒ අතරින් ඇතැම් ඒවා ඉටුවිය. තවත් ඒවාට මුලපුරන ලදී. සමහර පොරොන්දු ඉටුකිරීමට කිසිදු පියවරක් ගෙන නැත. බලය බෙදාගැනීම සඳහා හඳුන්වා දෙන ලද පළාත් සභා ක්‍රමය අක්‍රිය වීම ද අවධානය යොමු විය යුතු ගැටලුවකි.

• • •

මෙම පසුබිම තුළ ශ්‍රී ලංකාවේ තිරසර සාමය ඇති කිරීම සඳහා අප කළ යුතුව තිබෙන්නේ කුමක් ද?

ඒ පිළිබඳ සංවාදයක් ආරම්භ කරමු.

විමසීම් හා අදහස්:

Email: mail@righttolife.lk
Web: www.righttolife.lk
දුරකථනය: +94 112 669100